අරණායක ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

**1 මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කල මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති පොදු ගබඩා තොග රු. 75,690 ක් හා විදුලි උපකරණ තොග රු. 46,409 ක් මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොග ලෙස දක්වා නොතිබුණි.

(ආ) පොදු තැන්පතු ගිණුම හර හා වැය විෂයය බැර විය යුතු රු.10,420 ක් වැය විෂයය හර හා පොදු තැන්පතු ගිණුම බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.20,840 ක් අඩුවෙන් හා 2017 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත් සභා අරමුදල් - 2017 යටතේ ඉටු කරන ලද කර්මාන්ත 04 ක නිමි වැඩ වටිනාකම රු.587,073 ක් වුවත් ගිවිසුම්ගත වටිනාකම වූ රු. 630,718 ක් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් රු. 43,645 කින් වැඩියෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
---------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 93,466,333 ක් වූ අතර, ඊට අදාළ උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 104,040,343 ක් වූයෙන් වෙනස රු. 10,574,010 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**
-------------------

වසර 14 ක සිට ඉදිරියට ගෙන එන රු. 672,333 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 2,938,926 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 28,461 ක් විය.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 අංක 56 හා 2010 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත | 6,000 | සභා බල ප්‍රදේශය තුල පැවති කර්මාන්ත දෙකක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මු.රෙ. 104,105 හා 110 | 429,095 | සභාව සතු ජල බවුසරයකට සිදු වූ අනතුර පිළිබඳව වාර්තා කර නොතිබුණු අතර වාහනයක අලාභ හානි වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 371 | 99,000 | සමාලෝචිත වර්ෂය තුල ලබා දෙන ලද අත්තිකාරම් 07 ක් පියවීමේදී දින 06 සිට දින 27 දක්වා කාල ප්‍රමාදයක් සිදුව තිබුණි. |
| | | 40,983 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවන ලද අත්තිකාරම් 04 ක් තිබුණි. |

(iii) මු.රෙ. 1645 (අ) - සභාව සතු වාහන 12 කට අදාල ලොග් සටහන් පොත් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

(ඇ) සබරගමුව පළාත් පාලන කොමසාරිස් වරයාගේ අංක 2005/04 හා 2005 ජූනි 01 දිනැති චක්‍රලේඛය 112,242 නොවිකිණී ඇති ඉඩම් කට්ටිවලට අදාළව මුදල් අයකර ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,764,751 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,011,086 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------- | ------------------- | ------ | ----------- | -------------- | ------------------- | ------ | ------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,757,000 | 1.719,148 | 1,764,726 | 250,165 | 1,742,000 | 1,729,480 | 2,214,006 | 424,374 |
| කුලී | 1,823,500 | 1,708,480 | 1,742,332 | 118,027 | 1,265,700 | 1,510,310 | 1,563,869 | 152,779 |
| බලපත්‍ර ගාස්තු | 1,090,000 | 1,222,977 | 1,235,367 | 360 | 880,100 | 1,131,379 | 1,123,679 | 14,150 |
| වෙනත් ආදායම් | 45,147,560 | 76,776,923 | 31,453,050 | 28,729,210 | 49,031,800 | 46,378,557 | 31,871,808 | 19,131,208 |

#### 2.2.2 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේදී සිදු කරන ලද වරිපනම් බදු තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි.

(ආ) වරිපනම් බදු දේපල 105 කින් වර්ෂ 02 සිට වර්ෂ 29 දක්වා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 කුලී**

-----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2000 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සභාව සතු දේපල 04 ක් බදු දීම මත අයවිය යුතුව තිබුණු රු.93,743 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) පැරණි ගම්සභා ගොඩනැගිල්ල කුලියට දීම මත මසකට අයවිය යුතු රු. 5,000 ක කුලිය 2014 වර්ෂයේ සිට අය වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. 242,500 ක් අයවිය යුතුව තිබුණි. කුලී නොගෙවීම මත ගොඩනැගිල්ල සභාවට පවරා ගන්නා බව 2017 අගෝස්තු මාසයේදී බදුකරුට දන්වා තිබුණ ද එපරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

---------------

2017 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කලහැකි ව්‍යාපාර ආයතන 09 ක් වෙනුවෙන් වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

------------------

**ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු**

--------------------------------

සභා බල ප්‍රදේශයේ සවිකර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 40 කින් රු. 57,850 ක් හා තාවකාලික දැන්වීම් පුවරු 17 කින් රු. 7,312 ක් අයකර ගෙන නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 4,371,500 ක් හා රු.21,039,510 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

-------------------

2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ එකිනෙක කාර්යයන් නියමිත පරිදි ඉටුකර තිබේද යන්න අධීක්ෂණය කර නොතිබුණු අතර කාර්යයන් 05 ක් 2018 මාර්තු වන විටත් ඉටුකර නොතිබුණි.

**(ආ) ඉටු නොකල කර්තව්‍යයන්**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ අයවැය මඟින් යෝජිත රු. 700,000 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 04 ක් ඉටුකර නොතිබුණි.

(ii) 2014 දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ 850 ක ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද දිප්පිටිය මධ්‍යම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් නතර කර තිබුණි. ඉදිකිරීම් නතර වීම නිසා පඩිපෙලෙහි හා බිම් වල විවෘතව පවතින කම්බි දිරාපත් වෙමින් පැවතිණි.

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන අතර මසකට දළ වශයෙන් ටොන් 52 ක කසළ ප්‍රමාණයක් මාසික බදු පදනම මත ලබාගත් ඉඩමකට බැහැර කරමින් තිබුණි. ඒ සඳහා බදු කුලී වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.535,484 ක් ගෙවා තිබුණි.

(ii) අක්‍රමවත් ලෙස කැලි කසළ බැහැර කර තිබූ අතර සත්ත්ව කොටස් , පොලිතීන්, ප්ලාස්ටික් හා කර්මාන්ත ශාලාවලින් ඉවත ලන දෑ තැන තැන ගොඩ ගසා තිබුණි.

(iii) ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉඩමක් හෝ භූමියක් ඇති අයට පමණක් ගලි සේවාව සපයන අතර එවැනි භූමියක් නොමැති නාගරික ජනතාවට එම පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(iv) 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂයේ අප්‍රේල් මාසය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම හා මැයි මාසයේදී ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සැකසිය යුතු වුවත් 2018 මාර්තු වනවිටත් එම කටයුතු ඉටුකිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි මාසය වන විටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා ආදායම් ලෙස ගිණුම්ගත කල යුතු රු. 1,105,808 ක් වූ කසළ බඳුන් අලෙවි ආදායම්, ක්‍රීඩාපිටි කුලියට දීමේ ගාස්තු, ගලිසේවා ගාස්තු හා අනතුරු දායක ගස් ඉවත් කිරීමේ ගාස්තු වසර 02 කට වැඩි කාලයක් තිස්සේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ පළාත් පාලන මූලාධාර ලෙස 2009 වර්ෂයේ දී ලැබී තිබුණු රු. 41,628 ක් උපයෝජනය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) විද්‍යුත් පුස්තකාල සේවා වැඩසටහන සඳහා 2015 වර්ෂයේ දී උපකරණ ලබා දී තිබුණ ද 2018 මැයි වනවිටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

සභාවේ තනතුරු වර්ග 07 ක සේවක පුරප්පාඩු 07 ක් වූ අතර තනතුරු වර්ග දෙකක සේවක අතිරික්තය 03 ක් විය. සභාව සතුව පෙර පාසල් පාලිකා තනතුරක් අනුමත වී තිබුණද පෙර පාසලක් පවත්වාගෙන යාමට සභාව කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ඉඩම් වල අනවසර ඉදිකිරීම් 42 ක් නිරීක්ෂණය වූ අතර අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට හෝ නියමානුකූල කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු සුසාන භූමි 12 හි මුළු වපසරිය අක්කර 12 රූඩ් 03 පර්චස් 25 ක් පමණ වන අතර මෙම භූමි මැනුම් කොට නිසි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණ අතර, අනවසර පදිංචිකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**3.4.2 නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම**

වත්කම් ලේඛනවල සඳහන් ලිං 256 ක් නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යන්නේද හා එම ලිං ඉදිකිරීම සඳහා ලබා දී තිබුණු වර්ග අඩි 100 සිට වර්ග අඩි 750 දක්වා වූ ඉඩම් කොටස් පොදු පරිහරණය සඳහා යොදා ගන්නේ ද යන්න අධීක්ෂණය කර නොතිබුණි.

**3.4.3 වත්කම් ලේඛණගත නොකිරීම**

සභාව සතු අම්බලම් 10 කට අදාළව ඒවායේ ගොඩනැගිලිවල වපසරිය හා අම්බලමට අදාළ භූමියෙහි නම් හා එහි වපසරිය ලේඛනවල සටහන් කර නොතිබුණි. මෙම අම්බලම් පොදු පරිහරනයට යොදා ගන්නේ ද යන්න තහවුරු නොවුණි.

**3.4.4 පවරා නොගත් වත්කම්**

සභාව පරිහරනය කරන වාහන 20 කින් 11 ක අයිතිය සභාවට පවරාගෙනනොතිබුණි.

**3.4.5 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්**

අක්‍රිය වාහන 03 ක් සඳහා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාකාරී තත්වයේ පවතින වාහන 17 ක් සඳහා රියදුරන් 4 දෙනෙකු සේවයේ යොදවන බැවින් වත්කම් ඌණ උපයෝජනයක් සිදු වන බව අනාවරණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු විෂයයන් 39 ක එකතුව රු. 823,200 ක ප්‍රතිපාදන සියයට 100 ක් ද, වැය විෂයයන් 41 ක එකතුව රු.

5,682,408 ක ප්‍රතිපාදන වලින් සියයට 40 ත් සියයට 98 ත් අතර ද වශයෙන් එකතුව රු. 6,505,608 ක් උපයෝජනය කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | අවිනිශ්චිත ගිණුම නිරවුල් නොකිරීම |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (iii) | ජර්නල් සටහන් සඳහා පැහැදිලි සංලක්ෂය ඉදිරිපත් නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | | සැලකිය යුතු ප්‍රතිපාදන ඉතිරි කිරීම් තිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | හිග ආදායම් අයකර නොගැනීම |
| | | (ii) | බදුකුලී නිසි කලට තක්සේරු කර නොගැනීම |
| (ඇ) | වාහන පාලනය | (i) | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) | ගර්හිත හා අළුත්වැඩියා කළයුතු වාහන සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |